# 16. එකමුතු ව වැඩ කරමු

අපි සහෝදරයෝ වෙමු. එකිනෙකාට උදවු කර ගනිමු. මෙයට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් මඟ පෙන්වා ඇත.

එක් අවස්ථාවක් බලමු.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ ළමා වියේ දී කුරෙයිෂිවරුන් විසින් කඃබාව අලුත්වැඩියා කෙරිණි. එයට සියලු දෙනා ම සහභාගි වූහ. සමහරෙක් පොළොව කැපූහ. තවත් සමහරෙක් පස් ඇද්දාහ. තවත් සමහරෙක් ගල් ඇද්දාහ. තවත් සමහරෙක් ජලය ගෙනාහ. ළමා අවධියෙහි පසු වූ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ද එහි සිටියහ. අනෙක් අය සමග එකතු වී එතුමාණෝ ගල් ඇද්දාහ.

තවත් අවස්ථාවක් බලමු.

එක් දිනක් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ අනුගාමිකයන් සමග ගමනක් ගියෝ ය. දහවල් කෑම වේලාව පැමිණියේ ය. අතරමග ස්ථානයක නතර වී කෑම පිසීමට සූදානම් වූ හ. හැමෝ ම එක් එක් වැඩෙහි යෙදුණා හ. එහි දී නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ දර ගෙන ඒමේ වගකීම භාර ගත්හ.

අප අන් අය සමග එකමුතුව වැඩ කළ යුතු බව මේ අවස්ථා දෙක අපට පෙන්වා දෙයි. අපිත් අන් අය සමග එකතු වී වැඩ කිරීමට පුරුදු වෙමු.

## පැවරුම්

**වාක්‍ය දෙකෙන් නිවැරැදි වාක්‍යය ඉදිරියෙන් හරි (✓) ලකුණ යොදා අභ්‍යාස පොතේ ලියන්න.**

1. A. කඃබාව තනන විට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ගල් ඇද්දෝ ය.
   B. කඃබාව තනන විට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ එදා බලා ගෙන සිටියහ.
2. A. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ අනුගාමිකයන් සමග ගමනෙහි යෙදුණහ.
   B. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ සේවකයන් සමග ගමනෙහි යෙදුණහ.
3. A. අප අන් අය සමග එකතු වී වැඩ නොකළ යුතුයි.
   B. අප අන් අය සමග එකතු වී වැඩ කළ යුතුයි.
4. A. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ගමනක දී දර ගෙන ඒමේ වගකීම බාර ගත්හ.
   B. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ගමනක දී කෑම පිසීමේ වගකීම බාර ගත්හ.